# Trekmentor

බුදු දහම |රාජ්‍ය පාලනය |ලෝක සාමය

https://www.trekmentor.com/ https://www.lankagov.org/ info@trekmentor.com

---

කමල් වික්‍රමනායක, දිනය: 2026-03-10
41/1, රඹුක්කන පාර,
මාවතගම.

ගරු ජනාධිපති තුමා,
ජනාධිපති කාර්යාලය,
ගාලු මුවදොර,
කොළඹ 01.

ගරු ජනාධිපති තුමණි,

**ශ්‍රී ලංකා රේගුවේ Oracle Exadata XIIM මෘදුකාංග පද්ධතිය ප්‍රසම්පාදනය පිළිබඳවයි**

ශ්‍රී ලංකා රේගුව වෙත Oracle Exadata XIIM පද්ධතිය හා ඊට අදාළ මෘදුකාංග බලපත්‍ර සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය රුපියල් මිලියන 2,197.96 කට වසර 8ක කාලයක් සඳහා යම් පෞද්ගලික ආයතනයක් වෙත ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2026-03-09 දින අනුමත කර ඇති බව පුවත්පත් මාර්ගයෙන් දැනගතිමි.

තොරතුරු තාක්ෂණය පිළිබඳ වසර 25ක් ඉක්මවූ අත්දැකීම් ඇති මෘදුකාංග නිපදවීම (Software Development), ව්‍යාපාර තුළ තොරතුරු තාක්ෂණය භාවිතය (IT and Enterprise Architecture), හා තොරතුරු තාක්ෂණය පාලනය (IT Governance) පිළිබඳ ජ්‍යෙෂ්ඨත්වයක් ඇති මා හට අදාළ ප්‍රසම්පාදනය පිළිබඳ ලංකාවාසී ජනතාව වෙනුවෙන් ඔබතුමන්ව මෙසේ දැනුවත් කිරීම සුදුසු යැයි හැඟේ.

ගරු ජනාධිපති තුමනි, අදාළ ප්‍රසම්පාදනය පිළිබඳ මට පහත දැක්වෙන අදහස් ඇත:

1. මෙතරම් විශාල මුදලක් වියදම් කර මිල දී ගැනීමට බලාපොරොත්තු වන මෙම මෘදුකාංග පද්ධතිය සැබෑ අවශ්‍යතාවයට සරිලනවා ද?

   කොටළුවෙකුගෙන් කර ගත හැකි කාර්යයකට ඇතෙක් භාවිතා කරනවා වැනි ආකාරයට සුළු අවශ්‍යතා සඳහා ප්‍රභල හැකියාවන් ඇති මෘදුකාංග පද්ධති මිලදී ගෙන අති විශාල මුදල් කන්දරාවන් නාස්ති කරගන්නා අවස්ථා මම දැක ඇත්තෙමි. ශ්‍රී ලංකා රේගුවේ මෙම ප්‍රසම්පාදනය සැබෑ අවශ්‍යතාවය

බෙහෙවින්ම ඉක්මවා කෙරෙන ප්‍රසම්පාදනයක් නොවේ යැයි තහවුරු කරගැනීමක් කර ඇත් ද?

2. තොරතුරු තාක්ෂණය භාවිතයට අදාළ ශ්‍රී ලංකා රේගුවේ මූලධර්ම (Business Architecture Principles, Data Architecture Principles, Applications Architecture Principles and Technology Architecture Principles) මොනවා ද? ප්‍රසම්පාදනය කෙරෙන මෙම පද්ධතිය සහ එහි භාවිතයන් එම මූලධර්මවලට කෙතරම් අනුකූල ද?
3. වසර අටක් වෙනුවෙන් අදාළ පද්ධතිය සඳහා වියදම් කෙරෙන රුපියල් බිලියන 2.2 කට ආසන්න මුදලට ලැබෙන ප්‍රතිලාභය සාධාරණීකරණය කළ හැකි ද?
4. වසර අට ඉක්මවූ පසු අදාළ පද්ධතිය පවත්වාගෙන යැමේදී ශ්‍රී ලංකා රජයට එය කෙතරම් බරක් වේ ද?
5. මෙම ප්‍රසම්පාදනය කෙරෙන පද්ධතිය වෙනුවට අඩු වියදම් විකල්ප පවතී දැයි පරික්ෂා කර බැලුවා ද? එබඳු විකල්ප සලකා බැලුවේ නම් එම විකල්ප ඉක්මවා මෙම පද්ධතියම සුදුසු වන්නේ ඇයි?
6. පොදුවේ ගත් කළ තොරතුරු තාක්ෂණය වෙනුවෙන් රජය වර්තමානයේ විශාල මුදලක් වැය කරත් අනාගතයේදී දැරීමට සිදුවන පිරිවැය සාපේක්ෂව අඩු කර ගැනීමට වර්තමානයේ ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ මෙම පද්ධතියේ අවශ්‍යතාවය නිගමණය කිරීමේ දී සලකා බැලුවා ද?

මෙම විශාල ප්‍රමාණයේ වියදමින් ජනතාව උපරිම ප්‍රයෝජන ලබන බව තහවුරු කර ගැනීමත් රේගුවේ සැබෑ අවශ්‍යතාවය සහ එම අවශ්‍යතාවය සකසුරුවම් සහ දිගු කාලීනව ලාභදායී ආකාරයකට ඉටුකරගන්නා බව තහවුරු කර ගැනීමත් වැදගත් වේ. එසේ නොකොට මෙම පද්ධතිය මිල දී ගතහොත් එය තවත් එක් සුදු අලියෙක් වීමට හැකිය. එබැවින් මෙවන් විශාල ප්‍රමාණයේ වියදම් පිළිබඳ විශේෂ පරික්ෂාවකින් කටයුතු කිරීම යෝග්‍ය වේ.

එසේ හෙයින් අදාළ ප්‍රසම්පාදනය තාවකාලිකව නවතා දමා ඉහත කරුණු සහ තවත් සලකා බැලීමට සුදුසු කරුණු පිළිබඳ මාස 2-3 පමණ කාලයක් තුළ විෂය පිළිබඳ දැනුමක් ඇති විශේෂඥයින් පිරිසක් ලවා ඇගැයීමක් සිදුකර අදාළ ඇගැයීම සහ එහි ප්‍රතිඵල පිළිබඳ මහජනතාවද දැනුවත් කර සාධනීය බව පෙනේ නම් අදාළ පද්ධතියේ ප්‍රසම්පාදනය ඉදිරියට සිදුකරන මෙන් ඉල්ලා සිටිමි. සාධනීය බව නොපෙනේ නම් විකල්ප සඳහා යොමුවන මෙන් ඉල්ලා සිටිමි. කෙටි කාලීන පහසුව නොබලා දිගු කාලීන ප්‍රයෝජනය ඉලක්ක කරගනිමින් තීරණ ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

ස්තුතියි.

කමල් වික්‍රමනායක